108)

" ශ්‍රී ලංකාවේ සම අධ්‍යාපන අවස්ථා ඇතිකර ලීමේ
වැදගත්කම හා කලුතර දිස්ත්‍රික්කය තුල ඒ කෙරෙහි
බලපාන දුෂ්කරතා හා ගැටලු පිළිබඳ විමසීමක් "

කොළඹ විශ්ව විද්‍යාලයෙහි අධ්‍යාපන දර්ශනපති උපාධිය
සඳහා ඉදිරිපත් කෙරෙණ නිබන්ධනයයි.

UCLIB
411053

ජී. ඩී. රත්නපාල
(එම්. පිල්. 80/65)

1987

## සංක්ෂේපයෙන්

වර්තමානයේ අධ්‍යාපනය පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදී වූත් මානව අයිතිවාසිකම් අතර ප්‍රමුඛත්වයක් ගන්නා වූත් විශ්ව සාධාරණ අයිතියේ පොදු සමාජය බුක්ති විඳිය වූත් අයිතිවාසිකමක් හැටියට පිළිගැනේ. නමුත් න්‍යායාත්මකව මේ තත්වය පැවතුනත් ලෝකයේ සෑම රටකම මෙන් ප්‍රායෝගික ක්‍රියාකාරීත්වයෙහි දී නොයෙකුත් ගැටලු හා අසාධාරණතා මතු වී ඇත. ඒ අනුව සංවර්ධනය කරා ගමන් ගන්නා රටක් හැටියට ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ද මේ තත්වයෙහි වලංගුතාව පවතී.

මේ පර්යේෂණයෙන් උත්සාහ දරා ඇත්තේ ශ්‍රී ලංකාවේ සම අධ්‍යාපන අවස්ථා ඇතිකර ලීම කෙරෙහි බලපාන ගැටලු අවධාරණයට ලක් කොට ඒ පිළිබඳව සුදුසු විසඳුම් හා යෝජනා සලකා බැලීමය.

ජාතික වශයෙන් සම අධ්‍යාපන අවස්ථා ඇතිකර ලීමේ ගැටලු දිස්ත්‍රික්කයන් වශයෙන් සලකා බලන විට කලුතර දිස්ත්‍රික්කයේ ද පූර්ණ නියෝජනයක් දරන බව පෙනේ. ඒ නිසා කලුතර දිස්ත්‍රික්කය ඇසුරින් මේ ගැටලු විමසීමට අදහස් කර ඇත.

වැදගත් වූ ගැටලු තුනක් සම්බන්ධයෙන් විශේෂ අධ්‍යයනයක් කර ඒ පිළිබඳව විමර්ශණයක යෙදීමට ද අදහස් කර ඇත.